# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1831/10 - 2013 ඔක්තෝබර් මස 08 වැනි අඟහරුවාදා - 2013.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත**

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දෙන ලද විධානය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

වර්ෂ 2013 ක් වූ ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

2013 අංක 5 දරන මුදල් සමාගම් (පොලී අනුපාත) විධානය

1. 1.1 මෙම විධානය 2013 අංක 5 දරන මුදල් සමාගම් (පොලී අනුපාත) විධානය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී සෑම මුදල් සමාගමකටම අදාළ විය යුතුය. හැඳින්වීම

1.2 මෙම විධානයෙහි සඳහන් නියෝග, ඕනෑම ඉතිරිකිරීමේ තැන්පතු, කාලීන තැන්පතු, පැවරිය නොහැකි තැන්පතු සහතික සහ මෙම විධානයෙහි දිනයේ සිට භාරගනු ලබන හෝ අලුත් කරනු ලබන සහ නිකුත් කරනු ලබන ණය සාධන පත්‍ර සඳහා අදාළ විය යුතුය.

2. 2.1 කාලීන තැන්පතුවක් සඳහා මුදල් සමාගමක් විසින් ගෙවිය හැකි වාර්ෂික පොලී අනුපාතය පහත සඳහන් උපරිම පොලී අනුපාත සීමාවන් නොඉක්මවිය යුතුය ; කාලීන තැන්පතුවක් සඳහා උපරිම පොලී අනුපාතය

| *කාලීන තැන්පතුවක කල් පිරීමේ කාලය* | *උපරිම පොලී අනුපාත සීමාව* | |
|---|---|---|
| වසරක් හෝ ඊට අඩු | අධ්‍යක්ෂවරයා විසින් මුදල් සමාගම් වෙත දැනුම් දෙනු ලබන තැන්පතු භාර ගැනීමට පෙර කාර්තුවේදී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගයට | ප්‍රතිශත අංක 2.00 ක් එකතු කිරීමෙන් ලැබෙන අගය. |
| වසරකට වැඩි - වසර 3 ට අඩු | | ප්‍රතිශත අංක 2.50 ක් එකතු කිරීමෙන් ලැබෙන අගය. |
| වසර 3 ට වැඩි - වසර 5 ට අඩු | | ප්‍රතිශතය අංක 3.00 ක් එකතු කිරීමෙන් ලැබෙන අගය. |

2.2 වයස අවුරුදු 55 ට වැඩි පුද්ගලයකුගේ (මෙහි මින් මතු "ජ්‍යෙෂ්ඨ පුරවැසියා" ලෙස හැඳින්වෙන) කාලීන තැන්පතුවක් භාර ගැනීමේදී හෝ නැවත අලුත් කිරීමේදී, මුදල් සමාගම විසින් ඉහත (2.1) ඡේදයෙහි සඳහන් උපරිම පොළී අනුපාත සීමාවට වඩා ප්‍රතිශත අංක එකකට නොවැඩි අතිරේක පොලියක් ගෙවිය හැකිය.

**ඉතිරිකිරීමේ තැන්පතු සඳහා උපරිම පොලී අනුපාතය**

3. 3.1 මුදල් සමාගමක් විසින් ඕනෑම ඉතිරිකිරීමේ තැන්පතුවක් සඳහා ගෙවිය හැකි උපරිම වාර්ෂික පොලී අනුපාතය අධ්‍යක්ෂවරයා විසින් මුදල් සමාගම් වෙත දැනුම් දෙනු ලබන, පෙර කාර්තුවේදී නිකුත් කරන ලද දින 91 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය නොඉක්මවිය යුතුය.

3.2 ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් විසින් ඉතිරිකිරීමේ තැන්පතුවක් පවත්වාගෙන යාමේදී, ඉහත (3.1) ඡේදයෙහි සඳහන් උපරිම පොළී අනුපාත සීමාවට වඩා ප්‍රතිශත අංක එකක් නොඉක්මවන අතිරේක පොලියක් මුදල් සමාගමක් විසින් ගෙවිය හැකිය.

**පැවරිය නොහැකි තැන්පතු සහතික සඳහා උපරිම වට්ටම් අනුපාතය**

4. කල් පිරීමේදී නිදහස් කරවා ගත හැකි අගයට වඩා අඩු මිලකින් යුත් පැවරිය නොහැකි තැන්පතු සහතික නිකුත් කිරීමේ දී මුදල් සමාගම විසින් අනුමත කළ හැකි වට්ටම් අනුපාතය ඒ ඒ තැන්පතුව සම්බන්ධව පහත දක්වා ඇති උපරිම ඵලදායී අගය නොඉක්මවිය යුතුය ;

| *පැවරිය නොහැකි තැන්පතු සහතික සඳහා කල්පිරීමේ කාලය* | *ඵලදායි අගයෙහි උපරිම ඉහළ සීමාව* | |
|---|---|---|
| වසරක් හෝ ඊට අඩු | අධ්‍යක්ෂවරයා විසින් මුදල් සමාගම් වෙත දැනුම් දෙනු ලබන තැන්පතු සහතික නිකුත් කිරීමට පෙර කාර්තුවේදී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගයට | ප්‍රතිශත අංක 2.00 ක එකතුව. |
| වසරකට වැඩි - වසර 3 ට අඩු | | ප්‍රතිශත අංක 2.50 ක එකතුව. |
| වසර 3 ට වැඩි - වසර 5 ට අඩු | | ප්‍රතිශතය අංක 3.00 ක එකතුව. |

**ණය සාධන පත්‍රයක් සඳහා උපරිම වාර්ෂික පොළී/වට්ටම්/කූපන අනුපාතය**

5. මුදල් සමාගමක් විසින් ණය සාධන පත්‍ර සඳහා ගෙවිය හැකි උපරිම වාර්ෂික පොළී/වට්ටම් /කූපන අනුපාතය අදාළ කල්පිරීමේ කාලයක් සඳහා පහත දක්වා ඇති පොළී/වට්ටම්/කූපන අනුපාතයන්හි උපරිම ඉහළ සීමාව නොඉක්ම විය යුතුය ;

| *ණය සාධන පත්‍ර කල්පිරීමේ කාලසීමාව* | | *උපරිම වාර්ෂික පොළී/වට්ටම්/කූපන අනුපාතය* | | |
|---|---|---|---|---|
| වසරක් හෝ ඊට අඩු | | අධ්‍යක්ෂවරයා විසින් මුදල් සමාගම් වෙත දැනුම් දෙනු ලබන පෙර කාර්තුවේදී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය | ණය සාධන පත්‍ර නිකුත් කිරීමට පෙර | ප්‍රතිශත අංක 3.50 ක එකතුව. |
| පාවෙන අනුපාතය | වසරකට වැඩි - වසර 3 ට අඩු | | අදාල පොළී / කූපන කාලසීමාව ඇරඹීමට පෙර | ප්‍රතිශත අංක 4.25 ක එකතුව. |
| | වසර 3 ට වැඩි - වසර 5 ට අඩු | | | ප්‍රතිශත අංක 5.00 ක එකතුව. |
| ස්ථාවර අනුපාතය | වසරකට වැඩි - වසර 3 ට අඩු | | ණය සාධන පත්‍ර මහජනතාවට දැනුම් දීමට පෙර දිනය හෝ වට්ටම් දිනය | ප්‍රතිශත අංක 4.25 ක එකතුව. |
| | වසර 3 ට වැඩි - වසර 5 ට අඩු | | | ප්‍රතිශත අංක 5.00 ක එකතුව. |

**කාර්තුවකට බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය**

6. 6.1 අධ්‍යක්ෂවරයා විසින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, සහ දෙසැම්බර් 31 න් අවසන් වන කාර්තු සඳහා අදාළ වන දින 91 ක සහ දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා කාර්තුවකට බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය දැනුම් දිය යුතුය.

6.2 පොළී/වට්ටම්/කූපන ගෙවීමේ කාලසීමාවට පෙර ඒ ඒ කාලසීමාව සඳහා අදාළ වන කාර්තුවකට බර තබන ලද සාමාන්‍ය ඵලදායී අනුපාතය මුදල් සමාගම විසින් කොළඹ කොටස් හුවමාරුව වෙත සහ භාරකරුට දැනුම් දිය යුතුය.

7. සෑම මුදල් සමාගමක් විසින්ම කිසියම් මාසයකදී, එම මුදල් සමාගම් විසින් කාලීන තැන්පතු, ඉතිරිකිරීමේ තැන්පතු, පැවරිය නොහැකි තැන්පතු සහතික සහ ණය සාධන පත්‍ර සඳහා ගෙවන ලද පොළී/වට්ටම්/කූපන අනුපාත පිළිබඳ විස්තර එම මාසයට පසුව එළඹෙන මාසයේ 07 වැනි දින හෝ එදිනට ප්‍රථම, අධ්‍යක්ෂවරයා විසින් දෙන ලද උපදෙස් පරිදි එවිය යුතුය. වාර්තා කිරීම

8. මෙම විධානයෙහි, අර්ථ දැක්වීම

8.1 "කාලීන තැන්පතු" යන්නෙන් නිශ්චිත කාලසීමාවක් තුළ ආපසු ගෙවීමේ එකඟතාවක් මත මුදල් සමාගමක් විසින් භාරගනු ලබන ඕනෑම තැන්පතුවක් අදහස් වේ.

8.2 "ණය සාධන පත්‍ර" යන්නෙන් බැඳුම්කරයක්, ණයකරයක්, වාණිජ පත්‍රිකාවක්, පොරොන්දු නෝට්ටුවක් හෝ අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ණය සාධන පත්‍රයක් අදහස් වේ.

8.3 "අධ්‍යක්ෂවරයා" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ.

9. 2012 අංක 6 දරන මුදල් සමාගම් (පොළී අනුපාත) විධානය මෙයින් අහෝසි කරනු ලැබේ. අහෝසි කිරීම

10 - 676

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.